# මී මැසි පාලනය

මී මැසි පාලනය වැදගත් වන්නේ ඇයි?

මී මැස්සා නිපදවන මී පැණි ඖෂධීය ගුණයෙන් පොහොසත් ඉතා ප්‍රනීත ආහාරයක් බැවින් ආදි කාලයේ සිටම ජනතාව මී පැණි ආහාරයට ගැනීමට පුරුදුව සිටිති. වර්තමානයේ මී ඉටි, රාජ ජෙල්ලි, පරාග ප්‍රොපොලිස් (Propolis) හා මී මැස්සාගේ විෂ ද, මී මැසි නිෂ්පාදන වශයෙන් භාවිතා කෙරේ. මෙම ද්‍රව්‍යය ලබා ගැනීම සඳහා මී මැසි ජනපද නඩත්තු කිරීමේ ක්‍රියාවලිය, මී මැසි පාලනය යනුවෙන් හැඳින්වේ.

ඉතිහාසය සැලකීමේ දී, ආදී ශිලා යුගයේ සිටම මිනිසුන් මී පැණි භාවිතා කොට ඇත. නයිල් මිටියාවතේ විසූ ඊජිප්තු වැසියෝ මුලින්ම ගෘහස්ථව මී මැසි පාලනය කිරීම අරඹා ඇත. මී පැණි ගල්වා මළ සිරුරු ආරක්ෂා කර ඇති බව පිරමීඩවලින් හමුවන මමීවලින් ඔප්පු වී තිබේ. මී පැණිවල බහා දඩමස් කල් තබා ගැනීමට පුරුදු වී සිටීමත් ජන වහරේ එන බඹර ගී ගායනාවනුත්, ශ්‍රී ලංකාවේ ජනයා ද ආදියේ සිටම මී පැණි භාවිතා කළ බවට හොඳම නිදසුන් වේ.

මී මැස්සාගේ ස්වභාවික වාසස්ථාන වන වනාන්තරවල පිහිටි ගස් බෙන, ගල් රැකුල්, වේ හුඹස් වැනි ස්ථානවලින් මී වද දඩයම් කිරීමෙන් පැණි ලබා ගැනීම පාරම්පරිකව පැවත ආ මී පැණි ලබා ගැනීමේ ක්‍රමය විය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රමාණය සීඝ්‍රයෙන් අඩුවීමත් සමඟ ස්වභාවික වාසස්ථානවලින් මී පැණි සපයා ගැනීමේ හැකියාව ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.

ඖෂධීය ආහාරයක් වශයෙන් මී පැණිවල වටිනාකම පිළිබඳව දැනුවත්වීම තුළින් දේශීය වෙළෙඳපොළේ මී පැණි සඳහා වූ ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. දළ වශයෙන් මී පැණි ටොන් 100ක පමණ අවශ්‍යතාවයක් දේශීයව පවතින බව ගණන් බලා තිබේ. මෙයින් 66% ක පමණ ප්‍රමාණයක් විදේශ රටවලින් ආනයනය කරන බව රේගු වාර්තා අනුව පෙනී යයි. එමෙන්ම, ආනයනික මී පැණි ඉතා අධික මිල ගණන්වලට අලෙවි කෙරේ.

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක මී මැසි පාලනය කළ හැකි බැවින් දේශීය වෙළෙඳපොළේ මී පැණි අවශ්‍යතාවය සපුරාලීමට හැකි විභවතාවක් පවතී. මේ සඳහා දඩයම් කිරීමෙන් බැහැරව වඩාත් කාර්යක්ෂම වූ ද, විද්‍යානුකූල වූ ද, මී මැසි පාලන ක්‍රමවේදයක් යොදා ගැනීම අත්‍යවශ්‍යය.

ගෘහස්ථ මී මැසි පාලන ව්‍යාපාර මගින් වඩාත් කාර්යක්ෂම හා තිරසාර මී පැණි නිෂ්පාදන වැඩපිළිවෙළක් සළසා ගත හැකි වේ. මී පැණි දඩයම් කිරීමේ දී මී වද අතින් මිරිකීම මගින් මී පැණි නිස්සාරණය කර ගන්නා බැවින් අපිරිසිදු මී පැණි නිෂ්පාදනය වීම සිදු වේ. භාවිතා කරන උපකරණවල පිරිසිදුබව අඩුවීම හේතුවෙන් ද මී පැණි තවදුරටත් අපිරිසිදු වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස මී පැණි කල්තබා ගැනීමේ හැකියාව අඩු (පිරිසිදු මී පැණි බෝතලයක් විවෘත නොකර අවුරුදු 05 ක පමණ කාලයක් පැසීමට ලක් නොවී තබා ගත හැකිය) වේ. එබැවින්, වෙළෙඳ පොළ සඳහා සුදුසු ප්‍රමිතියකින් යුතු මී පැණි නිෂ්පාදනය සඳහා වඩාත් විද්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය පවතී.

වර්තමානයේ දේශීයව නිෂ්පාදනය වන මී පැණි සඳහා සංවිධානය වූ වෙළෙඳපොළක් නොතිබීම නිසා නිෂ්පාදිත මී පැණි ඉතා සුළු මුදලකට අතරමැදියන් විසින් ලබා ගන්නා බව සමීක්ෂණවලින් හෙළි වී තිබේ. මෙසේ අඩු මුදලකට ලබා ගන්නා මී පැණිවලට නොයෙකුත් ද්‍රව්‍ය මිශ්‍ර කර ප්‍රමාණය වැඩිකර විකිණීමේ කූට ජාවාරම්කරුවන් බහුලව සිටින බව වැඩිදුරටත් අනාවරණය වී ඇත. ගෘහස්ථ මී මැසි පාලනය තුළින් මී මැසි පාලකයන්ගේ සංවිධාන බිහිකළ හැකි වන අතර එමගින් වෙළෙඳපොළ සංවිධානය කිරීමේ පහසුව ද පිරිසිදු හා ප්‍රමිතියෙන් යුතුව මී පැණි සකස් කර වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ හැකියාව ද ලැබේ.

මී මැසි පාලනය පිළිබඳව ප්‍රායෝගික කුශලතාවයක් ඇති අයෙකුට මී මැසි පෙට්ටි 100 තනිවම නඩත්තු කිරීම පහසු කරුණකි. හොඳින් පාලනය කරනු ලබන මී මැසි

ජනපදයකින් මී පැණි බෝතල් 5-6ක අස්වැන්නක් වාර්ෂිකව ලබා ගත හැකි අතර මී පැණි බෝතලයක වර්තමාන මිල රු : 600/- කි. මී මැසි ජනපද 10 ක නඩත්තු කටයුතු සඳහා දිනකට උදෑසන හෝ සවස පැය 02 ක පමණ කාලයක් මිඩංගු කිරීම ප්‍රමාණවත් වන අතර එක් ජනපදයක් සතියකට වතාවක් පරීක්‍ෂා කිරීම ප්‍රමාණවත් වේ. එනිසා, මෙය ඉතාමත් ඵලදායී අතිරේක ආදායම් මාර්ගයකි. නිවසේ සිටින කාන්තාවන්ට ද, ළමයින්ට ද, පුහුණුවකින් පසුව මී මැසි ජනපද නඩත්තුව පහසුවෙන් සිදු කළ හැකිය. මී මැසි ගෝචර ශාක බහුල ප්‍රදේශවල පුද්ගලයන්ට මෙය ස්වයං රැකියාවක් වශයෙන් ද දියුණු කර ගත හැකිය.

කෘෂිකර්මාන්තයේ දී ගොවිබිම් තුළ මී මැසි ජනපද ඇති කිරීමේ දී, මී මැස්සන් මල්වල පරාගනයට දායක වන බැවින් බෝගවල ඵල හටගැනීමේ ප්‍රතිශතය වැඩි වේ. එබැවින්, බෝග අස්වනු ඉහළ යාම තුළින් ගොවියාගේ ආදායම වර්ධනය වේ. තව ද, බෝග අස්වනු ඉහළ යාම තුළින් ගොවියාගේ ආදායම ඉහළ නැංවීමට ද මී මැස්සා අනියම් වශයෙන් උපකාරී වේ.

විනෝදාංශයක් වශයෙන් ද මී මැසි ජනපදයක් නඩත්තු කිරීම කළ හැකිය. මී මැසි ජනපදයක චර්යා රටාව දෙස නෙත් යොමා සිටින අයෙකුට එහි ආශ්චර්යමත් බව තුළින් මානසික වින්දනයක් ද ලැබේ. එමනිසා මානසික සුවය සමඟ ඖෂධීය ආහාරයක් ලබා දෙන මී මැසි ජනපදයක් ගෙවත්තේ නඩත්තු කිරීම ඉතාමත් ඵලදායී කාර්යයක් බව සටහන් කළ යුතු වේ.

### මී මැසි පාලනය ආරම්භ කළ හැක්කේ කෙසේද?

බිඟු පාලනය ඇරඹීම සඳහා යොමු වන අයෙකුට ඒ පිළිබඳ යම් මූලික දැනුමක් ලබා තිබීම අත්‍යාවශ්‍ය කරුණකි. මේ සඳහා වඩාත්ම පහසු මඟ වන්නේ දැනට මී මැසි පාලනයේ යෙදෙන අයෙකු හා වැඩ කිරීමෙන් ලබා ගන්නා අත්දැකීම් වේ. මී මැසි පාලනය පිළිබඳ වඩා විද්‍යානුකූල ක්‍රමවේදයන් පිළිබඳ දනුම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලැබේ.

විද්‍යාත්මක මී මැසි පාලනයේ මූලික පදනම රඳා පවතින්නේ මී මැස්සන් ඇති කිරීමට භාවිතා කරන මී මැසි පෙට්ටි මත වේ. ශ්‍රී ලංකාවේ මී මැස්සාට සුදුසු ප්‍රමිතීන්ට අනුව සකස් කරන ලද මී මැසි පෙට්ටියක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හඳුන්වා දී තිබේ. මී මැසි පෙට්ටියට අමතරව දුම් ගැසීමේ උපකරණයක්, පැණි නිස්සාරණය කරන යන්ත්‍රයක්, මුහුණු ආවරණයක් හා ආරක්‍ෂක ඇඳුම් කට්ටලයක් ද හඳුන්වා දී ඇති බැවින්, මෙම උපකරණ භාවිතයෙන් මී මැස්සන්ගෙන් පහරකෑම වළක්වා ගෙන මී මැසි පාලනය විනෝදාංශයක් වශයෙන් කරගෙන යෑමට හැකියාව ලැබී ඇත.

මී මැසි පාලනයේ මූලාරම්භය සඳහා මී මැසි ජනපද සපයා ගත යුතු ය. මේ සඳහා ස්වභාවික පරිසරයේ තැන්පත්ව ඇති ජනපද පෙට්ටිවලට ඇතුළත් කර ගැනීමේ හැකියාව පවතී. එමෙන්ම, මී මැසි පාලනයේ යෙදෙන අයගෙන් මී මැසි ජනපද මිල දී ගැනීම ද සිදු කළ හැකිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පුහුණු කරන ලද මී මැසි පාලන උපකරණ නිෂ්පාදකයෝ හා මී මැසි පාලක කටයුතු පවත්වාගෙන යන ගොවීහු ද දිවයින පුරා විසිරී සිටිති. මෙම පුද්ගලයන්ගෙන් උපකරණ හා ජනපද ලබා ගැනීමේ හැකියාව පවතී.

## මී මැසි පාලනය

### මී මැසි ජනපදයක ක්‍රියාකාරීත්වය

මී මැසි ජනපද නඩත්තු කිරීමේ දී ජනපදයක් තුළ ක්‍රියාකාරීත්වය පිළිබඳව මී මැසි පාලකයාට අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍ය කරුණකි.

සත්ත්ව විද්‍යාත්මක වර්ගීකරණයේ දී බැඳි පියාපත් සහිත කෘමීන් අයත් වන *හයිමෙනොප්ටෙරා (Hymenoptera)* ගෝත්‍රයට මී මැස්සන් අයත් වේ. දෙබරුන් හා කුහුඹුවන් ද මෙම ගෝත්‍රයේ සාමාජිකයන් වේ. මී පැණි රැස් කරන බිඟුන් *ඒපිඩේ (Family - Apidae)* කුලය යටතේ බෙදා ඇති අතර මෙම කුලයට අයත් සතුන් රංචු හෙවත් ජනාවාස වශයෙන් ජීවත් වේ. මී මැස්සන් සතුරන්ට පහරදීමට භාවිතා කරන 'විත' ඇති නැති බව අනුව මී මැස්සන් *ඒපිස් (Apis)* විෂ සහිත බිඟුන් ගණයටත්, විත රහිත බිඟුන් *ට්‍රයිගෝනා (Trigona)* නමැති ගණයටත් ඇතුළු කර තිබේ.

ලොව පුරා මී මැසි විශේෂ 20,000 කට අධික සංඛ්‍යාවක් විසිරී ඇති නමුත් මී මැසි පාලනයේ දී බහුලව යොදා ගන්නේ ඒපිස් මෙලිෆෙරා *(Apis melifera)* හෙවත් යුරෝපීය මී මැස්සා සහ ඒපිස් සෙරානා *(Apis Cerana)* හෙවත් ආසියාතික මී මැසි විශේෂයන් පමණි. මෙයින් ඉන්දියානු උප මහද්වීපික ප්‍රදේශය හා ශ්‍රී ලංකාව ආශ්‍රිතව සිටින උප විශේෂය ඒපිස් සෙරානා ඉන්ඩිකා *(Apis cerana indica)* යනුවෙන් හැඳින් වේ. මෙම මී මැසි විශේෂයන් සංවෘත ස්ථානවල ඇති කිරීමට හැකියාව තිබේ. ශ්‍රී ලංකාවේ ජීවත්වන වෙනත් මී මැසි විශේෂ වන්නේ බඹරා *(Apis dorsata)*, දඬුවැල් මැස්සා *(Apis Floria)* සහ කනෙයි මැස්සා *(Trigona irridipennis)* ය.

මී මැසි ජනපදවල සිටින රැජිණන් විසින් ඔවුන්ගේ මුඛයේ ඇති ග්‍රන්ථියක් මගින් ස්‍රාවය කරනු ලබන පෙරමෝනයක් මගින් තමන්ගේ රංචුව එක්ව තබා ගැනීම සිදු කෙරෙයි. මෙම පෙරමෝනය, රැජිණ සුවඳ (Queen substance) නමින් හඳුන්වන අතර එහි සුවඳ එකිනෙකාට විශිෂ්ඨ වේ. මෙම සුවඳ මගින් ජනපදයේ මැස්සන් එකිනෙකා හඳුනා ගන්නා අතර වෙනත්, ජනපදයකින් පැමිණෙන මැස්සන් හඳුනාගෙන පළවා හැරීමට හැකියාව ලැබේ. මේ අනුව, ජනපදයේ පැවැත්ම රඳා පවතින්නේ රැජිණ මත වේ.

වැඩකාර මැස්සිය කහ - දුඹුරු පැහැතිය. උදර කොටස ඉරි සහිත ය. වැඩකාර මැස්සියගේ උපතේ සිට එක් එක් වයස් සීමාවන් අනුව ශ්‍රම විභජනයක් දක්නට ලැබේ.

**මී මැස්සියකගේ (වැඩකාර) කාර්යභාරය**

| වයස | ඉටු කරනු ලබන කාර්යය |
|---|---|
| දින 01 - 07 | ❍ පවිත්‍ර කිරීම<br>❍ රැජිණ සහ පැටවුන්ට ආහාර සඳහා රාජ ජෙලී නිෂ්පාදනය කිරීම<br>❍ රැජිණ හා කීටයන් රැක බලා ගැනීම සහ පෝෂණය කිරීම |
| දින 07 - 14 | ❍ ඉටි නිෂ්පාදනය<br>❍ වද බැඳීම හා පිලාකෝෂ සහ පැණි කුටීර ඉටි යොදා ආවරණය කිරීම |
| දින 14 - 21 | ❍ කැදැල්ල තුළ වායු සංසරණය ඇති කිරීම<br>❍ කැදැල්ල ආරක්ෂා කිරීම |
| දින 21 සිට මිය යන තෙක් ..... | ❍ ආහාර රැස් කිරීම |
| | **(වැඩකාර මැස්සියකගේ ජීවිත කාලය මාස 03 ක් පමණ වේ.)** |

***මූලාශ්‍රය : මී මැසි සංවර්ධන ඒකකය, බිඳුණුවැව, බණ්ඩාරවෙල.***

මී මැසි සනාවාසයක් ගත් විට එය ඉටියෙන් තැනූ ෂඩාශ්‍රාකාර කුහර සහිත එකිනෙකට සමාන්තරව බැඳි වද රැසකින් යුක්ත වේ. මෙම වද වසා සිටින මී මැස්සන් රංචුවක් දක්නට ලැබේ. මෙම මී මැසි රංචුව හෙවත් සනාවාසයට මී මැසි රැජිණ, වැඩකාර මැස්සන් හා පිරිමි මැස්සන් අයත් වේ.

මී මැසි රැජිණ ශරීර ප්‍රමාණයෙන් අනෙක් මැස්සන්ට වඩා විශාල වන අතර ශරීරය කහ දුඹුරු පැහැයක් ගනී. වැඩකාර මැස්සිය හා රැජිණ යන දෙදෙනාම ගැහැණු සතුන් නමුත් බිත්තර දැමීමේ හැකියාව ඇත්තේ රැජිණට පමණි.

පිරිමි මැස්සන් කලු පැහැයෙන් යුක්ත බැවින් පහසුවෙන් හඳුනාගත හැකිය. වැඩකාර මැස්සියන්ට වඩා විශාල වන අතර ඉලිප්පුනු ස්වභාවයක් ගන්නා විශාල සංයුක්ත ඇස් යුගලයක් පිහිටා තිබේ. මෙම සතුන් විත රහිත ය. ආහාර රැස් කිරීම සඳහා ශරීරය හැඩගැසී නොමැති බැවින් වැඩකාර මැස්සියන් මගින් පෝෂණය කරනු ලැබේ.

එම නිසා, ඕනෑම ආහාර අහේනියක දී ආහාර නො ලැබීම හේතුවෙන් පිරිමි මැස්සන් මිය යෑම ස්වභාවික සංසිද්ධියකි. නව ජනපද බිහිවීමේ දී බිහිවන අලුත් රැජිණන් හා පට්ටි

වැඩීමේ ක්‍රියාවලිය (ප්‍රජනනය) සඳහා වැදගත් වේ.

### මී මැස්සාගේ සන්නිවේදන ක්‍රම

මී මැස්සාට භෞතික සන්නිවේදන හැකියාව මෙන්ම රසායනිකව ද සංවේදනය ලබා ගැනීමේ හැකියාව පවතී.

රසායනික සන්නිවේදනය සඳහා විශේෂිත රසායන ද්‍රව්‍ය කොටසක් වන පෙරමෝන භාවිතා වේ. රැජිණ විසින් නිපදවන රැජිණ සුවඳ බිඟු සනාවාසයක නිරෝගී පැවැත්ම සහ ප්‍රශස්ථ ක්‍රියාකාරීත්වය සඳහා තිබිය යුතු වැදගත් පෙරමෝනයකි. විත විදීමේ පෙරමෝනය වැඩකාර මැස්සන්ගේ විත් අවයවය තුළ නිපද වේ. *අයිසොපෙන්ටයිල් ඇසිටේට්* මෙහි වඩාත් ක්‍රියාකාරී සංඝටකයක් වන අතර සතුරු ආක්‍රමණයක දී අන් අයට එය දැන්වීමට උපයෝගී කර ගනී. මේ මගින් විෂ නිපදවීමේ ග්‍රන්ථිය උත්තේජනය කරයි. මේ හැරුණු විට වැඩකාර මැස්සියෝ තම සාමාජිකයන් ඔවුන් සිටින ස්ථානය වෙත ගෙන්වා ගැනීමට ද පෙරමෝනයක් භාවිතා කරති. *දිශානත පෙරමෝනය (Orientation pheromone)* නමින් හැඳින්වෙන මෙම රසායනික ද්‍රව්‍යය වැඩකාර මැස්සියගේ උදරයේ පසුපස පිහිටා ඇති නෙසොනොව් ග්‍රන්ථියේ (Nesonov Gland) නිපද වේ.

මී මැස්සාගේ භෞතික සන්නිවේදනයට හොඳම උදාහරණය වන්නේ 'බිඟු නැටුම' (Bee Dance) වේ. ආහාර ප්‍රභවයක් සොයා ගත් මැස්සෙකු කැදැල්ලේ සිටින අනෙකුත් සාමාජිකයන්ට එය දන්වීම සඳහා කරනු ලබන රිද්මාකාර ශරීර චලන බිඟු නැටුම නමින් හඳුන්වයි. මෙහි දී, මී මැස්සා අර්ධ කවයක ගමන් කර එක්වරම සරල රේඛාවක් ඔස්සේ ඔහුගේ උදරය දෙපසට වනමින් ගොස් නැවතත් කවය හමුවන තැන දී විරුද්ධ දිශාවට නැවතත් වටයට ගමන් කොට කවය සම්පූර්ණ කරයි. මෙහි දී, උදරය වනමින් ගමන් කරන රේඛාව ආහාර ප්‍රභවය තිබෙන දිශාව දක්වයි.

උගේ පසුපසින් ගමන් කරමින් අනෙකුත් බිඟුන් ආහාර ප්‍රභවය ඇති දිශාව හඳුනා ගනී.

**බිඟු නැටුම**



මී මැසි ජනපදයකට ලං වී සුළු කැළඹීමක් ඇති කළ විට එතුළින් රිද්මාකාර ශබ්දයක් නිකුත් වේ. මෙය මී පිඹීම වශයෙන් හැඳින් වේ. මෙය තම කැදැල්ල වෙතට ලං නොවන ලෙස නිකුත් කෙරෙන සංඥාවක් වේ. එබැවින් ජනපදයක් පරීක්ෂා කිරීමට පෙර මෙම ශබ්දය ඉවත්ව යන තෙක් සිට එයට දුම් ගසා පරීක්ෂා කිරීම සුදුසු ය.

### මී පැණි නිෂ්පාදනය

වැඩකාර මැස්සිය මලින් මලට පියඹා ගොස් මල්වලින් උරා බොන පැණි, උගේ ආමාශය තුළ රැස් වේ. ආමාශය අවසාන කෙලවර කපාටයක් මගින් වැසී ඇති බැවින් එය පැණි රැස් කරන මල්ලක් ලෙස ක්‍රියා කරයි. ආමාශය තුළ දී කාබෝහයිඩ්‍රේට් ජීර්ණ එන්සයිම මගින් මල් පැණිවල ඇති සංකීර්ණ සීනි, ජීරණය කර ග්ලූකෝස් සහ ෆ්‍රුක්ටෝස් යන සරල සීනි බවට පත් වේ. මෙම ක්‍රියාවලිය මගින් මල් පැණි, මී පැණි බවට පරිවර්තනය කෙරේ. සීනි වර්ගවලට අමතරව ශාක වලින් ලැබෙන්නා වූ වෙනත් ඖෂධීය රසායනික සංයෝග මී පැණි තුළ අන්තර්ගත වේ. මී පැණි සෑදීම අවසාන වූ පසු ආමාශය තුළ ඇති මී පැණි වද කුහරවලට වමාරා තැන්පත් කරනු ලබයි. මී මැස්සන් රංචු වශයෙන් එක්ව තටු සලමින් ඇති කරන වායු ධාරා මගින් මී පැණිවල ජලය වාෂ්පීකරණය කර 76% පමණ සීනි අඩංගු සීනි ද්‍රාවණයක් බවට මී පැණි පත් කෙරේ. සකස් කළ පැණි සහිත කුටීර, ඉටි තට්ටුවක් යොදා ආවරණය කරනු ලැබේ.

**මී ඉටි නිෂ්පාදනය**

මී මැස්සාගේ උදරයේ යට පැත්තේ පිහිටා ඇති ඉටි ග්‍රන්ථි මහින් ඉටි ශ්‍රාවය කරනු ලැබේ. වාතය හා ගැටුණු පසු ඝණ බවට පත්වන ඉටි කැබලි එකිනෙක අලවා වද බැඳීම සිදු කරයි. ඉටි නිෂ්පාදනය සඳහා ආහාරයට ගන්නා පැණිවල අඩංගු කාබෝහයිඩ්‍රේට් උපයෝගී කර ගන්නා බැවින්, මී ඉටි කිලෝවක් නිෂ්පාදනයට මී පැණි කිලෝ 12 ක් ආහාරයට ගත යුතු බව ගණනය කර ඇත. එහෙයින් ,මී වද ආරක්ෂා කර ගැනීම තුළින් සංචිත ආහාර ඉතිරි කර ගැනීමට හැකි වන බව මී මැසි පාලකයින් සිහි තබා ගත යුතු ය.

**බිඟු චක්‍රය**

පරිසරයේ පවතින කාලගුණික හා දේශගුණික තත්ත්ව අනුව මී මැසි ජනපදවල වර්ධනය එක්තරා රටාවකට අනුව සිදු වේ. ජනපදවල වර්ධනය, වර්ධක කාලය, පැණි නිෂ්පාදන කාලය හා අහේනි කාලය වශයෙන් චක්‍රයක ආකාරයෙන් සිදුවන බැවින් බිඟු චක්‍රය නමින් හඳුන්වනු ලබයි.

වර්ධක කාලයේ දී ජනපදවල මැස්සන්ගේ ගහණය වැඩිවීම, අලුතෙන් වද බැඳීම, ජනපද රංචු බෙදී ගොස් නව ජනපද බිහිවීම, ආහාර රැස්කර, තැන්පත් කිරීමත් සිදු වේ. මී මැසි පාලනය ආරම්භ කරන අයෙකුට ජනපද පෙට්ටිවල තැන්පත් කර ගැනීමට සුදුසුම කාලය වර්ධක කාලයයි. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ජනවාරි සිට අගෝස්තු දක්වා මාසවල වර්ධක කාලය එළැඹේ. පහතරට තෙත් කලාපයේ වර්ධක කාලය දෙසැම්බර් මාසයේ දී ආරම්භ වේ. මෙම කාලයේ දී කට්ටි බෙදීමෙන් ජනපද බෝ කිරීම කළ හැකිය.

පැණි නිෂ්පාදන කාලය හෙවත් පැණි වාරය වශයෙන් හඳුන්වන්නේ ජනපදවල විශාල වශයෙන් පැණි ගබඩා කර ඇති කාලයයි. අස්වැන්න නෙලා ගන්නේ මෙම කාලයේදී ය. අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා ප්‍රධාන පැණි වාරයත් සමඟ මාර්තු - අප්‍රේල් මාසවල දී සුළු පැණි අස්වැන්නකුත් ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල දී දැක ගත හැකිය. රබර් වැවෙන ප්‍රදේශවල ප්‍රධාන පැණි වාරය එළඹෙන්නේ රබර් දළු ලා වැඩෙන පෙබරවාරි සිට අප්‍රේල් දක්වා වූ කාලයේ දීය.

පැණි රැස් කරන කාලයෙන් පසු එළැඹෙන මෝසම් වර්ෂා කලෙයේ දී, මී මැස්සාට ආහාර හිඟ වන නිසා අහේනි කාලය වශයෙන් හැඳින්විය හැකිය. මෙම කාලයේ දී, ආහාර හිඟය නිසා ජනපදවල බෝවීම සීඝ්‍රයෙන් අඩුවන අතර පැණි වාරය අවසානයේ සිටි මැස්සන් ප්‍රමාණය ද ක්‍රමයෙන් අඩුවන බව දකිය හැක. වදවල සංචිත ආහාර භාවිතයට ගන්නා බැවින් ගබඩා කර ඇති පැණි අවසන් වූ පසු බොහෝ විට මී මැසි ජනපද වාසස්ථානය අතහැර පලා යැමට පෙළඹේ. මෙම කාලයේ දී, විලෝපිකයින්ගේ ආක්‍රමණය වැඩි විය හැකි අතර මී වදවලට හානි කරන 'ඉටි පණුවා' ගේ හානිය ද උග්‍ර විය හැකිය. මෙම සතුරු ආක්‍රමණ නිසා ද, ජනපද හැර යාම සිදු වේ. එහෙයින්, මෙම කාලයේ දී ජනපද පිළිබඳ ප්‍රවේශම්කාරී වීමත් ආහාර හිඟ අවස්ථාවල අතිරේක ආහාර සපයා ජනපද ශක්තිමත් ව පවත්වා ගැනීමත් මී මැසි පාලකයාගේ වගකීමකි.

මී මැස්සාගේ හැසිරීම් රටාවත්, පරිසර තත්ත්ව මගින් ඇතිවන බලපෑමත් මත මී මැසි පාලනයේ සාර්ථකත්වය රඳා පවතින බැවින් එම කරුණු පිළිබඳව අවබෝධයකින් යුතුව මී මැසි පාලන ව්‍යාපාර ආරම්භ කළ යුතු ය.

මී මැස්සන්ට අවශ්‍ය ආහාර ලබා ගත හැකි ගෝචර ශාකත්, මල් පිපෙන රටාවත් අනුව පැණි නිෂ්පාදනය තීරණය වේ. එසේ වුවද, මී මැස්සා ප්‍රිය කරන ගෝචර ශාක බහුලව ඇති ප්‍රදේශ මෙන්ම මී මැස්සා ප්‍රිය කරන දේශගුණික තත්ත්වයන් යටතේ මී මැසි ජනපද නඩත්තු කිරීම මගින් මී මැසි පාලන ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යා හැකි වේ.



**ඒ.එම්.ඩී. අතපත්තු**
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂිකා
මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව
බණ්ඩාරවෙල